# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 160/42 — 1975 අප්‍රේල් 19 වැනි සෙනසුරාදා — 1975.04.19

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරනු ලැබේ)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය : ඩබ්ලිව්. 68(50)/75.

**මහාජන ආරක්ෂක ආඥාපනත (40 වන අධිකාරය)**

අගමැතිගේ නිර්දේශය අනුව මහාජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබූ නියෝග.

වි. ගොපල්ලව,
ජනාධිපතිවරයා.

1975 අප්‍රේල් 19 වන දින,
නුවරඑළිය,
ජනාධිපතිවරයාගේ කාර්යාලයේ දී ය.

**නියෝග**

1. මෙම නියෝග 1975 අංක 4 දරණ හදිසි අවස්ථා (රජය පෙරළීම වැළැක්වීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. කිසිම තැනැත්තකු විසින්, ජාතික රාජ්‍ය සභාවේ කාර්ය පටිපාටිය හෝ යම් අධිකරණයක් ඉදිරිපිට පැවැත්වෙන නඩු කටයුතු මගින් හැර, වාචික ලෙස හෝ හැසිරීමෙන් හෝ කරනු ලබන වෙනත් යම් නිරූපණයකින් ශ්‍රී ලංකා ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ එහි යම් විධිවිධානයක වලංගු භාවය ප්‍රතික්ෂේප කිරීම හෝ වෙනත් යම් අන්දමකින් එයට විරෝධය පෑම හෝ අභියෝග කිරීම හෝ නොකළ යුත්තේය.

එසේ වුවද කවරවූ හෝ ආකාරයකින් ශ්‍රී ලංකා ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වලංගු භාවය ප්‍රතික්ෂේප නොකරමින් හෝ එහි වලංගු භාවයට අභියෝග නොකරමින් හෝ එහි වලංගු භාවය ප්‍රශ්න නොකරමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි විධිවිධාන සළසා ඇති පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පූර්ණයෙන්ම හෝ එහි යම් කොටසක් වෙනස් කිරීමට යමෙකු විසින් උද්ඝෝෂණය කිරීම, මෙම නියෝග යටතේ වරදක් නොවන්නේය.

3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හෝ එය යටතේ පිහිටුවනු ලැබූ හෝ පත් කරනු ලැබූ හෝ පිහිටුවනු ලැබූ ලෙස හෝ පත් කරනු ලැබූ ලෙස සැළකෙන යම් ආයතනයක හෝ නිලධාරින්ගේ අධිකාරයට හානිකර ලෙස ක්‍රියා කිරීමට හෝ කවරවූ හෝ ආකාරයකින් විරෝධය පෑමට හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සාදනු ලැබූ හෝ පනවනු ලැබූ හෝ පිළිගනු ලැබූ නීතිවලට එරෙහිව හෝ හානිකර ලෙස ක්‍රියා කිරීමට කෙළින්ම හෝ අන් ආකාරයකින් කිසිම තැනැත්තකු විසින් වාචික ලෙස, හෝ හැසිරීමෙන් හෝ කරනු ලබන යම් නිරූපනයකින් යම් තැනැත්තකු පෙළඹවීම, දිරිගැන්වීම ඔහුට අනුබල දීම හෝ නොකළ යුතුය.

4. පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් සංවිධානය කරනු ලැබූ රැස්වීමකදී හෝ පිළිගත් දේශපාලන පක්ෂයක සඟරාවක හෝ ප්‍රවෘත්ති පත්‍රයක පළ කිරීමෙන් හෝ මේ විධිවිධාන යටතේ කරනු ලැබූ වරදකට අධිකරණයක් විසින් යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ අවස්ථාවක ඒ දේශපාලන පක්ෂයට නීතිය යටතේ හිමිවන පිළිගත් දේශපාලන පක්ෂයක තත්ත්වය අහිමි වන්නේය. තවද,

(අ) ඒ දේශපාලන පක්ෂයට අයත් සියළු චංචල හා නිශ්චල දේපළ ශ්‍රී ලංකා ජනරජය සතු වූ ලෙස සලකනු ලැබිය යුතුය. තවද,

(ආ) මෙම නියෝග ක්‍රියාත්මක වූ දිනයෙන් පසු ඒ දේශපාලන පක්ෂය විසින් හෝ එම පක්ෂය වෙනුවෙන් එකී දේපළ සම්බන්ධයෙන් කරනු ලැබූ යම් අන්සතු කිරීමක් හෝ වෙනත් යම් බැහැර කිරීමක් අවලංගු හා බල රහිත වූ ලෙස හා අවලංගු හා බලරහිත වන ලෙස සැළකිය යුතුය.

5. මෙම නියෝග යටතේ යම් වරදක් සඳහා යම් අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව කරනු ලැබූ දිවුරීමකින් හෝ ප්‍රකාශයකින් බැඳී සිටින අවස්ථාවක, ඒ වරද සඳහා අධිකරණය විසින් නියම කරනු ලබන වෙනත් යම් දඬුවමකට අතිරේකව,—

(අ) ඒ තැනැත්තාගේ සියළු චංචල හා නිශ්චල දේපළ ඒ වරදකරු කිරීම හේතු කොටගෙන, ශ්‍රී ලංකා ජනරජය සතුවූ ලෙස සලකනු ලැබිය යුතුය. තවද,

(ආ) මෙම නියෝග ක්‍රියාත්මක වූ දිනයෙන් පසු ඒ තැනැත්තා ඒ දේපළ සම්බන්ධයෙන් කරනු ලැබූ යම් අන්සතු කිරීමක් හෝ වෙනත් යම් බැහැර කිරීමක් අවලංගු හා බලරහිතවූ ලෙස හා අවලංගු හා බලරහිත වන ලෙස සැළකිය යුතුය.

6. මේ නියෝගවල කාර්යය සඳහා " පෙළඹවීම " යන්නෙහි යම් ත්‍යාගයක් පිරිනැමීම හෝ පොරොන්දුවීම හෝ යම් තර්ජනයක් දඬුවමක් හෝ දණ්ඩනයක් එල්ල කිරීම ද ඇතුළත් වන්නේය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී